# කළුතර ප්‍රාදේශීය සභාව

## කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 27 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය, ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂයට සමාන විය යුතු වුවත්, ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම ගිණුම් දෙක අතර රු.659,162 ක වෙනසක් පැවතුනි.

(ආ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කර්මාන්ත වියදම රු.5,831,503 ක් විය යුතු වුවත්, රු.5,449,088 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් කර්මාන්ත වියදම රු.382,415 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) දේශීය ණය සංවර්ධන අරමුදලේ 2016 දෙසැම්බර් මාසයට අදාල ගෙවිය යුතු රු.39,650 ක ණය වාරිකය ණය ගිණුමට හර කර ණය හිමියන් බැර කල යුතු වුවත් ණය ගිණුම වෙනුවට ආදායම් වියදම් ගිණුමට හර කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සංවර්ධන අරමුදල් ණය ගිණුමේ ශේෂය රු.39,650 කින් වැඩියෙන්ද, සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.39,650 කින් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල රු.384,637 ක් වූ ස්ථාවර තැන්පත් පොලී ආදායම, වෙනත් ආදායම් යටතේ නොදක්වා වැටුප් ප්‍රතිපූර්ණ යටතේ දැක්වීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණ රු384,637 ක් වැඩියෙන් හා වෙනත් ආදායම් රු.384,627 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු.25,060 ක් වටිනා තණකොල කපන යන්ත්‍ර දෙක ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධනයට ආදායමින් දායක වීමේ ගිණුම් රු.25,060 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී රු.315,451 ක් වටිනා ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම පුනරාවර්තන වැය යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයට අදාල පොදු සැපයුම් ණයහිමි රු.32,957 ක්, කර්මාන්ත ණයහිමි රු.115,235 ක් හා විශ්‍රාම වැටුප් ණයහිමි රු.33,474 ක් වර්ෂයේ ණයහිමි ලෙස මූල්‍ය ප්‍රකාශනවල නොදැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ණයහිමි වටිනාකම රු.181,666 ක් අඩුවෙන් හා වර්ෂයේ වියදම රු.181,666 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඌ) 2016 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට ගෙවිය යුතු මුදල රු.61,333 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල රු.41,495 ක් ලෙස දක්වා තිබීමෙන් ණයහිමි වටිනාකම රු.19,838 ක් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයට අදාල වරිපනම් හා බදු ආදායම රු.10,124,353 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.10,234,854 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු ආදායම රු.110,501 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඒ) පළාත් පාලන ආයතනවල යටිතල පහසුකම් නගා සිටුවීමේ වැඩසටහන යටතේ එක් කර්මාන්තයක් සඳහා රු.566,381 ක කර්මාන්ත ණයගැති හා ණයහිමි වටිනාකම අඩුවෙන් හා බස්නාහිර පළාත් සංවර්ධන ප්‍රදාන වැඩසටහන යටතේ එක් කර්මාන්තයක් සඳහා රු.43,034 ක කර්මාන්ත ණයගැති හා ණයහිමි වටිනාකම අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඔ) ඉකුත් වර්ෂයට අදාල සභා කර්මාන්ත ණයහිමි රු.400,000 ක වටිනාකම සමුච්චිත අරමුදලට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ඇතුළත් කර තිබීමෙන් වර්ෂයේ වියදම රු.400,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.37,403,194 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සත්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.44,588,304 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු. 28,476,359 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,111,945 ක වර්ධනයක් විය.

මූල්‍ය ප්‍රතිඵලයේ රු.16,111,945 ක වර්ධනය කෙරෙහි ආදායම් රු. 15,965,209 කින් වැඩිවීම හා වියදම් රු.146,736 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000’ | රු.000’ | රු.000’ |
| (i) වරිපනම් හා බදු | 10,235 | 8,295 | 4,618 |
| (ii) බදු කුලී | 156 | 120 | 52 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,966 | 1,966 | -- |

2.2.2 **වරිපනම් බදු**

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.5,669,771 ක හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.3,104,936 ක් හෙවත් සියයට 55 ක් අයකරගෙන තිබුණි. පසුගිය වර්ෂයට අදාල හිඟයෙන් රු.2,564,835 ක් තවදුරටත් අයවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට බිල් කිරීම් රු.9,358,209 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.7,374,633 ක් හෙවත් සියයට 79 ක් අයකරගෙන තිබුණි. ප්‍රවර්තන බිල් කිරීමෙන් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟය රු.1,983,575 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය රු.4,548,410 ක් වූ අතර ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණයට අනුව වර්ෂ 3 ට වැඩි වරිපනම් බදු ඒකක 1854 කින් රු.2,395,768 ක මුදලක් අයවීමට තිබූ අතර අය නොවන වරිපනම් බදු සම්බන්ධව විනිග්‍රහ බලපත්‍ර නිකුත් කිරීමට හෝ දේපල තහනම් කිරීමේ කටයුතු සිදු කර නොතිබුණි.

2.2.3 <u>කර්මාන්ත බදු/ ව්‍යාපාර බදු/ වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

කර්මාන්ත බදු, ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු ගෙවිය යුතු පුද්ගලයින් හා ආයතනවලින් එක් එක් වර්ෂය ආරම්භයේදීම ඉහත බදු මුදල් අය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට කර්මාන්ත බදු රු.19,650 ක් හා ව්‍යාපාර බදු රු.46,850 ක හිඟ ශේෂයක් පැවතුණ අතර මෙම හිඟ මුදල් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 53,809,684 |
| (ii) | මුද්දර ගාස්තු | 87,231,976 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම්/කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 වර්ෂයේ ආරම්භක ශේෂය ගබඩාවෙන් ලද තොග උපලේඛන සමග ගැලපීම සඳහා ජර්නල් සටහන් 16 හා 17 න් සිදු කළ වෙනස්කම් මගින් ජනනය වූ රු.75,695 ක ශේෂය හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) පොදු ගබඩා, ක්ෂේත්‍ර ගබඩා හා පුස්තකාල ගිණුම්වල ආරම්භක ශේෂයන් පිළිවෙලින් පොදු ගබඩා රු.373,446 ක් හරටද, ක්ෂේත්‍ර ගබඩා ගිණුම රු.297,651 ක් බැරටද, පුස්තකාල පොත් ගිණුම රු.659,161 ක් හරටද ගැලපීම් කර ගිණුම්වල ඉදිරිපත් කිරීම හේතුවෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල යථා තත්වය නිරූපනය නොවන බව නිරීක්ෂණය වේ.

(ඇ) 2016 වර්ෂය තුළ ගොඩනැගිලි අයදුම්පත් 599 ක් ලැබී ඉන් 58 ක් ප්‍රතික්ෂේප වී, 541 ක් අනුමත වී තිබූ අතර ඉන් 20 කට පමණක් අනුකූලතා සහතික ලබා දී තිබුණි. අනුකූලතා සහතික ලබා නොගත් ගොඩනැගිලි අයදුම්පත් සඳහා අනුකූලතා සහතික ලබා දී නව වරිපනම් තක්සේරුවක් සිදු කර වරිපනම් ආදායම අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) <u>බැංකු සැසඳුම්</u>

(i) මහජන බැංකුවේ අංක 039-1-001-2-2997958 (සාමාන්‍ය ) ගිණුමට අදාල 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව 2009 වර්ෂයේ සිට පැවත එන චෙක්පත් තුනකට අදාලව රු.16,372 ක් වූ උපලබ්ධි නොවූ ශේෂයක් නිරවුල් කිරීමකින් තොරව බැංකු සැසඳුම් ප්‍රකාශයේ දිගින් දිගටම ඉදිරියට ගෙනවිත් තිබුණි.

(ii) 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද බැකු සැසඳුම් ප්‍රකාශය අනුව සෘජු බැරවීම් ලෙස රු.3,523,860 ක් හා සෘජු බැරවීම් මන්ත්‍රී දීමනා ලෙස රු.319,800 ක ශේෂයක් හඳුනාගැනීමකින් තොරව බැංකු සැසඳුම් ප්‍රකාශයේ වසර කිහිපයක සිට දිගින් දිගටම පැවතුණි.

(ඉ) <u>ඇටවිල ආදාහනාගාරය</u>

මුළු පිරිවැය ඇස්තමේන්තුවක් නොමැතිව 2011 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම ආදාහනාගාරය ඉදිකිරීම සඳහා 2016 දෙසැම්බර් 31 දින වන විට රු. 14,037,636 ක මුදලක් වැය කර තිබුණි. මේ වන විට වසර 6 ක් ඉක්ම වුවත් මෙහි වැඩ අවසන් කර මහජන අවශ්‍යතාවය සඳහා යෙදවීමට අපොහොසත් වී තිබුණි.

(ඊ) <u>දේපල කළමනාකරණය</u>

සභාවේ ඉඩම් ගොඩනැගිලි ඇතුළු සියළු දේපල සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ නොපැවැත්වීම, ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම, නාගොඩ සහ මොරොන්තුඩුව උප කාර්යාලවල 2007 සිට 2014 දක්වා ඉඩම් වෙන්දේසිවලට අදාල ලිපිගොනු විගණනයට ලබා නොදීම සහ වෙන්දේසි ඉඩම්වලින් පොදු පහසුකම් සඳහා සභාවට ලබා ගත යුතු ඉඩම් කොටස්වලට අදාල ඔප්පු ලබා ගෙන නොතිබීම යනාදී කරුණු නිරීක්ෂණය විය.

(උ) <u>ත්‍රීරෝද රථ නැවතුම්පල බලපත්‍ර ගාස්තු අය නොවීම</u>

2012 මාර්තු 27 දිනැති මහාසභා තීරණ අංක 7.1.2 මගින් ත්‍රීරෝද රථ නැවතුම්පල බලපත්‍ර ගාස්තු ලෙස එක් ත්‍රීරෝද රථයකින් රු.600 ක් බැගින් අය කිරීමට තීරණය කර අතුරු ව්‍යවස්ථා පනවා තිබුණද 2015 වර්ෂය සඳහා ත්‍රිරෝද රථ 509 කින් රු.305,400 ක් හා 2016 වර්ෂය සඳහා ත්රීරෝද රථ 578 කින් රු.346,800 ක් වශයෙන් එකතුව රු.652,200 ක බලපත්‍ර ගාස්තුවක් 2017 මාර්තු 17 දින වන විටත් අයකරගැනීමට සභාව කටයුතු කර නොතිබු අතර එම හිඟ ගාස්තු ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි.

(ඌ) <u>වාහන පාලනය</u>

(i) සභාව සතු වාහන 45 ක් අතරින් ට්‍රැක්ටර් රථ 03 ක්, ට්‍රේලර් 05 ක්, ගල් රෝලක්, වතුර බවුසරයක් සහ අත් ට්‍රැක්ටරයක් අක්‍රීය තත්ත්වයේ පවතින අතර ඒවා අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී ඩබල් කැබ් රථයක් අනතුරට පත්වීමෙන් අළුත්වැඩියා සඳහා වැය වූ මුදලින් රු.57,150 ක් රක්ෂණ සංස්ථාව පියවා නොතිබූ අතර එම මුදල සභා අරමුදලින් දරා තිබුණි.

## 3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශයේ එක් රැස්වන කසළ කළුතර නගර සභාව වෙත භාර දෙනු ලබන අතර කසළ කළමනාකරණය සම්බන්ධයෙන් පහත අඩුපාඩු නිරීක්ෂය විය.

(අ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා නොතිබුණි.

(ආ) බැහැර කරන ස්ථානය සඳහා පරිසර බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි.

(ඇ) කසළ කළමනාකරණය සඳහා වැය වන පිරිවැය ආවරණය කිරීම සඳහා කසළ බදු පනවා නොතිබුණි.

## 3.3 කාර්යසාධනය

සභාවේ ජංගම ගිණුමේ මාසික සාමාන්‍ය ශේෂය රු. මිලියන 13 ඉක්මවා තිබූ අතර ඊට අමතරව රු. මිලියන 6.4 ක ස්ථාවර තැන්පතු පැවතුණි. මේ අනුව සභාවේ මූල්‍ය තත්ත්වය යහපත් මට්ටමක පැවති නමුත් සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ක්‍රියාත්මක කර ඇති ප්‍රාග්ධන ව්‍යාපෘති ගණන 6 ක් විය. ඒ අතරින් කර්මාන්ත 2 ක් ලෙස ඉටු කර තිබුණේ කාර්යාලයීය තීන්ත ආලේප කිරීමකි. මේ අනුව වර්ෂය තුල ආරම්භ කර තිබුණේ සභා අරමුදල් කර්මාන්ත 4 ක් පමණක් වූ අතර ඉන් වර්ෂය තුළ සම්පූර්ණ කර තිබුණේ එක් කර්මාන්තයක් පමණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පාලනය

(ඇ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඈ) වාහන පාලනය

(ඉ) අයවැය පාලනය